# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

''මිහිකත මැදුර'' ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர" காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல. ☎ 011 279 7400
"Mihikatha Medura" Land Secretriat, 1200/6, Rajamalwatta Road, Battaramulla 011 286 4051


මගේ අංකය / எனது இல / My No: LCGD/PI/LDO/1/40
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2025.07.02

චක්‍රලේඛ අංක 2020/2 (1)

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු

ඉඩම් කොමසාරිස් / සහකාර ඉඩම් කොමසාරිස් ( අන්තර් පළාත් )

**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති දීමනාපත්‍ර වල පසු කටයුතු**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් මගින් 2020.02.06 වන දින නිකුත් කරන ලද 2020/2 චක්‍රලේඛයේ සඳහන් උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී මේ වන විට නිර්මාණය වී ඇති ප්‍රායෝගික ගැටලු හඳුනාගෙන ඒ අනුව තවදුරටත් පරිශීලනයේ පහසුව මෙන්ම සෑම කාර්යාලයක් මගින්ම ඒකාකාරී ලෙස දීමනාපත්‍රවල පසු කටයුතු සිදු කිරීම අරමුණු කරගෙන මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

**II කොටස**

**දීමනාපත්‍රවල වරද නිවැරදි කර ගැනීම**

**වරද නිවැරදි කිරීමේ සීමා**

චක්‍රලේඛ අංක 2020/ 02 හි II කොටසෙහි දීමනාපත්‍රවල වරද නිවරදි කිරීමේ ක්‍රමවේද යටතේ (ඇ) හි විස්තර කරන පරිදි “නිවැරදි කළයුතු තරම් වරදක් ඇති බවට හා එම වරද යමකු විසින් හිතා මතා සිදු කල වරදක් නොවන බවට සෑහිමකට පත්විය යුතුය. තවද අදාළ වරද ඉඩම් ලෙජරයේ සහ බලපත්‍රයේ සඳහන් තොරතුරුවලට අනුකූල වන තරමේ නිවැරදි කිරීමක් අවශ්‍ය වන වරදක් විය යුතුය. මේ යටතේ සම්පූර්ණයෙන්ම ඉඩම පිළිබඳව විස්තර හෝ සම්පූර්ණයෙන්ම දීමනාපත්‍ර හිමියා වෙනස් වන ආකාරයේ සංශෝධන සිදු කල නොහැක” යනුවෙන් දක්වා ඇත. එසේ වුවද දීමනාපත්‍රයට අදාල ඉඩමෙහි සම්පූර්ණ තොරතුරු වෙනස් වන පරිදි සංශෝධන සිදු කිරීම සඳහා දීමනාපත්‍රය අවලංගු කර නව දීමනාපත්‍රයක් සැකසීම සඳහා ඔබ විසින් මා වෙත යොමු කරන බව නිරීක්ෂණය වේ.

එබැවින් සම්පූර්ණ ඉඩමේ විස්තරය සංශෝධනය කිරීමට අවශ්‍ය වන අවස්ථා වලදී දීමනාපත්‍රය ඇමුණුම 14 මගින් රජය වෙත භාර දීමට දීමනාපත්‍රකරු එකඟ නොවන අවස්ථාවලදී පමනක් චක්‍රලේඛ අංක 2022/04 හි සඳහන් වැරදි තොරතුරු මත සකස් කරන ලද දීමනාපත්‍රයක් අවලංගු කිරීමේ ක්‍රමවේදය අනුව අවලංගු කරන්න.

**III කොටස**

**දීමනාපත්‍රවල උරුමය සහතික කිරීම**

1. III වන කොටසෙහි 4 වන ඡේදයේ සඳහන් කර ඇති පරිදි “ උරුම සාරෝපනය වීම දීමනාපත්‍රකරුගේ මරණය සමගම නීතිය ක්‍රියාත්මක වීම මත සිදු වේ” යනුවෙන් යෙදීම මගින් ඉඩම් සංවර්ධන ආඥා පනතෙහි 72 හා 73 වගන්ති වලට පටහැනි ලෙස තීරණය ලබා දීම සිදුවන බව නිරීක්ෂණය වී ඇති බැවින් එම වාක්‍ය ඛණ්ඩය මුල් චක්‍රලේඛයෙන් ඉවත් කරනු ලැබේ.


ආයතන / நிர்வாகம் / Admin ☎ 011 279 7479, 011 287 3033 | ඉඩම් බදු / காணி குத்தகை / Land Lease ☎ 011 279 7423, 011 287 3110 | පර්යේෂණ හා සංවර්ධන / ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி / Research & Development ☎ 011 2874025, 011 287 3812 | ප්‍රතිපත්ති හා විමර්ශන / கொள்கை மற்றும் விசாரணை / Policy & Invistigation ☎ 011 279 7482, 011 2883635 | ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 583, 011 286 446

2. චක්‍රලේඛ අංක 2020/02 හි III කොටසෙහි දීමනාපත්‍රවල උරුම සහතික කිරීම යටතේ දක්වා ඇති පරිදි "ජීවිත භුක්තියට නිකුත් කර ඇති දීමනාපත්‍රයක් ජීවිත භුක්ති කොන්දේසි සහිතව නිකුත්කර ඇති බැවින්, ජීවිත භුක්ති කරුගේ මරණින් පසු එම දීමනාපත්‍රය මත පසු කටයුතු කිරීම සුදුසු නොවන බැවින් ජීවිත භුක්තියට නිකුත්කර ඇති දීමනාපත්‍රය අවලංගු කර උරුමකරු නමින් නව දීමනාපත්‍රයක් සැකසීමට කටයුතු කරන්න" යන්නෙන් උපදෙස් ලබා දී ඇති වුවද, අවලංගු කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වා දී නොමැති බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල මගින් විවිධ වූ ක්‍රමවේදයන් අනුගමනය කරන බව නිරීක්ෂණය වේ.

ඒ අනුව, ජීවිත භුක්තියට නිකුත්කර ඇති දීමනාපත්‍රය ජීවිත භුක්ති කරුගේ මරණින් පසුව ශුන්‍ය හා බල රහිත බවට ලියාපදිංචි කිරීමේදී පහත උපදෙස් අනුව කටයුතු කරන්න.

ජීවිත භුක්ති දීමනාපත්‍රකරුගේ මරණ සහතිකය සමඟ මිය ගිය පුද්ගලයාත්, ජීවිත භුක්ති දීමනාපත්‍රකරුත් එකම පුද්ගලයකු බවට සහතික කර, ජීවිත භුක්තියට නිකුත් කරන ලද දීමනාපත්‍රය හා එහි කාර්යාල පිටපත සමඟ අදාල ප්‍රාදේශීය ලේකම්/ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් විසින් මෙහි හඳුන්වා දී ඇති ඇමුණුම 15 ආකෘති පත්‍රය අනුව ප්‍රකාශය පිටපත් 3 කින් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අදාල පත් ඉරුවේ ලියාපදිංචි කර, ඉන් පිටපත් 2ක් ආපසු ගෙන්වා ගෙන එක් පිටපතකින් අවලංගු කල ජීවිත භුක්ති දීමනාපත්‍රය සමඟ දීමනාපත්‍ර වෙළුමේ ගොනුකර ඒ බවට මුල් බලපත්‍රයේ ලෙජරයේ සටහනක් යොදා මුල් බලපත්‍රයට අදාලව බලපත්‍රකරුගේ උරුමකරු වෙත මුල් උරුමය ලබා දෙන්න.

ඉන් පසුව අවලංගු කරන ලද ජීවිත භුක්ති දීමනාපත්‍රයේ පිටපතක් හා මුල් අයිතිය ලබාදුන් ලෙජරයේ පිටපතක් සමඟ 19 (4) වගන්තිය යටතේ උරුමකරු වෙත නව දීමනාපත්‍රයක් සකස් කිරීමට අදාල ලේඛන මා වෙත යොමු කරන්න.

**මේ වන විට ජීවිත භුක්ති දීමනාපත්‍ර සකස් නොකළ බලපත්‍ර සඳහා පහත පරිදි කටයුතු සිදු කරන්න.**

බලපත්‍රකරු මිය ගිය අවස්ථාවකදී සහ කලත්‍රයා ජීවතුන් අතර සිටින අවස්ථාවකදී ඉඩම් සංවර්ධන ආඥා පනතේ 68 වගන්තියෙන් දක්වා ඇති කොන්දේසි සපුරා ඇත්නම් කලත්‍රයා වෙත බලපත්‍රයේ සහ ලෙජරයේ ජීවිත භුක්තිය ලියාපදිංචි කරන්න. එකී ජීවිත භුක්තිය සඳහා ජීවිත භුක්ති දීමනාපත්‍රයක් සැකසීමට අවශ්‍ය නොවන අතර ජීවිත භුක්තිය අවසන් වීමත් සමඟ නව උරුමකරු වෙත නව දීමනාපත්‍රයක් සකස් කිරීමට කටයුතු සිදු කරන්න.

**IV** කොටස

<u>විවිධ ගැටලු නිසා කාර්යාලයේ රඳවාගෙන ඇති දීමනාපත්‍ර</u>

<u>කිසිවෙකු අයිතිවාසිකම් නොකියන දීමනාපත්‍ර</u>

චක්‍රලේඛ අංක 2020/02 හි iv කොටසේ (3) හි සඳහන් කිසිවෙකු අයිතිවාසිකම් නොකියන දීමනාපත්‍ර අවලංගු කිරීමේදී ඇමුණුම 09 නිවේදනය භාෂා ත්‍රිත්වයෙන්ම මා වෙත යොමු කිරීමටත්, එම නිවේදන ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු විරෝධතා සලකා බැලීම සඳහා සති 3 ක කාලයක් ගැනීමටත් කටයුතු කරන්න.

මේ සම්බන්ධ යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් මා විමසන්න.

චන්දන රණවීර ආරච්චි

ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්

01. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කරු.දැ.ගැ.ස
02. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත් සහ ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
03. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස
04. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරු දැනුවත් කිරීම සඳහා
05. සියළුම පලාත් ඉඩම් කොමසාරිස්වරුන් - මෙම චක්‍රලේඛයේ පරිදි අදාල අවශ්‍යතාවයන්ට උපදෙස් ලබා දීම සඳහා
06. දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු.දැ.ගැ.ස
07. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස
08. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය - කරු.දැ.ගැ.ස

ප්‍රදානය වලංගු නොවන බව
ප්‍රකාශ කිරීම

ඇමුණුම 15

මගේ අංකය - .............................................
2020.............................මස..................දින,
.................................කාර්යාලයේදී.

ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,
..................................................

**<u>1969 අංක 16 දරණ පනතින් හා 1981 අංක 27 දරණ ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වගන්තිය යටතේ නිකුත් කරන ලද ජීවිත භුක්ති ප්‍රදාන පත්‍රයක් ශුන්‍ය හා බලරහිත වන බවට ප්‍රකාශ කිරීම.</u>**

........................................පළාත් සභාවේ, ..........................................ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් .............................................. .................................................. වන මම, 1969 අංක 16 දරණ පනතින් හා 1981 අංක 27 දරන ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 19 ................................................. මස ..................................................... දින අත්සන් තබා ඇති අංක ............................................. දරණ ජීවිත භුක්ති ප්‍රදාන පත්‍රය ........................................................... පදිංචි ................................................. වෙත පහත උපලේඛනයේ දක්වා ඇති ඉඩම සඳහා ප්‍රදානයකොට දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක .......................................... යටතේ ..................................දින ලියාපදිංචි කරනු ලැබ ඇතත්, අතිගරු ජනාධිපතිතුමා විසින් එකී ජීවිත භුක්ති ප්‍රදානපත්‍රයේ හිමිකරු වන ......................................... යන අය මිය ගොස් ඇති බව පෙනී යන බැවින්, එම ජීවිත භුක්ති ප්‍රදානය අවලංගු කිරීමට අනුමැතිය ලබාදෙන බවත් ඒ අනුව ජීවිත භුක්ති දීමනාපත්‍රය අවලංගු වන බව අදාල පත්තිරුවේ සටහන් කරන්න.

<u>උපලේඛනය</u>

| <u>ප්‍රදාන පත්‍ර අංකය</u> | <u>ලියාපදිංචි කළ අංකය</u> | <u>ලියාපදිංචි කළ දිනය</u> |
|---|---|---|
| ............................... | ........................................... | ............................................ |

මෙම ලිපියේ පිටපත් 03 ක් මේ සමඟ එවමි.

..............................................................
ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම්
කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්